# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2152/66 – 2019 දෙසැම්බර් 06 වැනි සිකුරාදා – 2019.12.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිගම් කෝරළේ උතුර සුළු කොට්ඨාසයේ, දිගනහේන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක MR/AKR/2018/389 හා 2019.04.04 දිනැති ප්‍රගමන අනුරේඛනයේ දැක්වෙන පහත සඳහන් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – අළුත්හේන – ප්‍රමාණය: හෙක්. 3.0122**
උතුරට: නමුණුකුල වතු සමාගම හිමිකම් කියන අළුත්හේන සහ මාර්ගය; නැගෙනහිරට: මාර්ග (ප්‍රාස) සහ නමුණුකුල වතු සමාගම හිමිකම් කියන අළුත්හේන; දකුණට: නමුණුකුල වතු සමාගම හිමිකම් කියන අළුත්හේන සහ මාර්ගය; බටහිරට: මාර්ගය සහ නමුණුකුල වතු සමාගම හිමිකම් කියන අළුත්හේන.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/15/2018/VE/168.
2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහ ලේකම් කාර්යාලය,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

12-745

---

### ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/3/2017/NRD/415.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 4/1/6/9.

2019.03.02 දින අංක 2112/49 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශයෙහි අනු අංක 25 හි ''කැබලි අංක 24'' යන්න ප්‍රමාද දෝෂයකින් සටහන් වී ඇති අතර එය ''කැබලි අංක 25'' ලෙස සංශෝධනය වියයුතු බව කාරුණිකව දන්වමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2019 නොවැම්බර් මස 15 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහ ලේකම් කාර්යාලය,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

12-65


1A – G 31627 – 31 (2019/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*